ඒකාබද්ධ සේවා චක්‍රලේඛ ලිපි - 01
මගේ අංකය: PA/CS/POLICY/චක්‍රලේඛ
ඒකාබද්ධ සේවා අංශය,
රාජ්‍ය පරිපාලන,පළාත් සභා, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2015.02.12

අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ උපදෙස් ක්‍රියාත්මක කිරිම සහ
<u>මහජන අවශ්‍යතාවන් ඉටුකිරීමේදී ආචාරශීලී වීම.</u>

රාජ්‍ය පරිපාලන,පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අංශය සමස්ථ රාජ්‍ය සේවයේම ඒකාබද්ධ සේවාවට අයත් නිලධාරීන්ගේ ආයතනික කටයුතු සිදුකරනු ලබන අංශය වේ.

02. මේ හේතුවෙන් දෛනිකව අති විශාල සේවාලාභීන් පිරිසක් තම සේවා අවශ්‍යතා ඉටුකර ගැනීම පිණිස ඒකාබද්ධ සේවා අංශයට පැමිණීම හේතුවෙන්, ඒකාබද්ධ සේවා අංශයේ නිලධාරීන්ට නිසිකලට සේවාලාභීන්ගේ රාජකාරී කටයුතු ඉටු කිරීමට ද අපහසු වී ඇත.

03. කරුණු මෙසේ හෙයින් සතියේ සෑම සඳුදා සහ බදාදා දිනකදීම සේවාලාභීන්ගේ සේවා අවශ්‍යතා වෙනුවෙන් ඒකාබද්ධ සේවා අංශයේ සියළුම නිලධාරීන් කැපවී සිටින බැවින් ද අංශයේ ඕනෑම නිලධාරියෙක් හමුවී තම ගැටළුව විසඳා ගැනීමට පහසුකම් සළසා ඇති බැවින් ද ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/කාර්යාලයේ නිලධාරීන්ට තම සේවා අවශ්‍යතා ඉටුකර ගැනීම පිණිස සතියේ **<u>සඳුදා හෝ බදාදා දින පමණක්</u>** මේ සමඟ අමුණා ඇති ආකෘතිය ද සමඟ ඒකාබද්ධ සේවා අංශයේ නිලධාරීන් හමුවීමට පැමිණෙන ලෙස උපදෙස් ලබා දෙන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

05. මේ සම්බන්ධයෙන් ඔබගෙන් ලැබෙන සහයෝගය ඉතා අගයකොට සලකමි.

කේ.වී.පී.එම්.ජේ.ගමගේ
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

**<u>සේවා අවශ්‍යතා සඳහා ඒකාබද්ධ සේවා අංශයට පැමිණෙන එම සේවයේ නිලධාරීන් විසින් නිසි පරිදි සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු ආකෘති පත්‍රය.</u>**

01. නිලධාරියාගේ/නිලධාරිණියගේ නම :-............................................................

02. තනතුර :-............................................................

03. සේවා ස්ථානය :-............................................................

04. හමුවිය යුතු නිලධාරියා :-............................................................

05. කාරණය(සැකෙවින්) :-............................................................

.........................................................................................................................

---

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය.

මෙම කාර්යාලයේ සේවයේ නියුතු..................................................මයා/මිය/මෙනවිය තම සේවා අවශ්‍යතාවය ඉටුකර ගැනීම සඳහා මා දැනුවත්ව ඔබ ආයතනය වෙත පැමිණෙන බව මෙයින් සහතික කරමි.

අත්සන :-................................................

නම :-................................................

තනතුර :-................................................

---

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.